පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : සිංහල

සතිය- 0 6

ශ්‍රේණිය11 :

Prepared by- කෑගල්ල කලාප අධ්‍යාපන කාර්යාලය

1 පැවරුම

පාඩම;- "අපටත් වැසිකිළියක්"

"සිංහල සාහිත්‍යයට අනඟි සේවාවක් කල කේ.ජයතිලක ශූරීන් 1926.06.27 වන දින කිරිදිවැල රදාවානේදී උපතලැබූ අතර ඔහු "කන්නිමහර ප්‍රාඥයා" යන විරුදාවලියෙන්ද හඳුන්වයි. ළමා අත්දැකීමක් වසුතු විෂය කරගත් උත්තම පුරුෂ දෘෂ්ඨී කෝණයෙන් රචිත මෙම කෙටි කතාව ඔහු විසින් 1984 දී පළකළ "නොනිමි සිත්තම සහ තවත් කෙටි කතා" සංග්‍රහයෙන් උපුටා ගැනිනි.

1.1 මෙම පාඩමට අදාල හැඳින්වීම කියවා කේ. ජයතිලක මහතාගේ සාහිත්‍ය නිර්මාණ ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| කෙටි කතා | නව කතා | ළමා කතා | නාට්‍ය | චරිතාපදාන |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

1.2ඔහු ලේඛකයෙකු ලෙස ලැබූ සම්මාන නම් කරන්න.

02.මෙම කෙටි කතාව කියවා එහි රන අවස්ථා හා සිදුවීම් පෙළගස්වන්න.

03.චරිත ලක්ෂණ දෙකක්වත් ඉස්මතු කරමින් පහතචරිත ගැන කෙටි විස්තර ලියන්න.

I. මම (කථකයා)
II. අක්කා
III. තාත්තා

04.පහත වචනවල අරුත් පැහැදිලි කරන්න.

I. යාප්පු වන්නට
II. දඬ කන්න වේවි.
III. මගෝඩියක්
IV. අධෝමුංඩය
V. කැසිකිළිය
VI. ක්ෂුද්‍ර ප්‍රාණීන්

05.මෙම කෙටි කතාවේ ඇතුළත්වන දෙබස් ඛණ්ඩ එකතුවක් සාදා ඒවා කවුරුන් විසින්, කාහට, කුමන අවස්ථාවක ප්‍රකාශ කරනලද ඒවාදැයි ලියන්න.

06.වැසිකිළි භාවිතය පිළිබඳව එදා ගැමියන් තුළ තිබූ ආකල්ප හා මතවාද හෙළිවන අවස්ථාවලටඋදාහරණ හැකිතාක් උපුටා දක්වන්න.

07“උගත් දේ ගැන තර්කානුකූලව සිතීම නිසා වැසිකිළිය භාවිතා කිරීමේ ජයග්‍රහණය ලබන්නේ කථකයාය.” මේ කියමන සනාථ කිරීමට හැකිතාක් උපුටා ගැනීම් රැස් කරන්න.

08.මෙම කෙටි කතාවට යොදාගෙන ඇති භාෂාවේ පහත විශේෂතා එහි සාර්ථකත්වයට හේතු වී ඇත.ඒවාට හැකිතාක් උදාහරණ උපුටා දක්වන්න.

I. ගැමි වහර යොදා ගැනීම
II. ගැමි දිවියෙන් උකහාගත් උපමා රූපක භාවිතය
III. සාම්ප්‍රදායික යෙදුම් භාවිතය
- ඉඟිවැකි
- යුගලපද
- පිරුළු

Iv.සජීවී සංවාද යොදා ගැනීම.

09.මෙම කෙටි කතාවේ අරමුණු ඉටුකර ගැනීමට එහි චරිත කොතෙක් දුරට ඉවහල් වී ඇත්දැයි නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න